www.AlevelApi.com

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
முன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

* **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

I කොටස

1. (i) බ්‍රාහ්මණ වර්ණයට නියම කර තිබූ ස්වධර්ම ගෙනහැර දක්වන්න.
(ii) යාගයක් අංග සම්පූර්ණ වීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා කෙටියෙන් දක්වන්න.
(iii) බ්‍රාහ්මණ ඉගැන්වීම් මගින් ශුද්‍ර වර්ණයට අහිමි කළ කාර්ය **පහක්** සඳහන් කරන්න.
(iv) නිගණ්ඨනාතපුත්තතුමන්ගේ මූලික ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.
(v) බ්‍රාහ්මණ ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම පිණිස ශ්‍රමණ සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාධක ගෙනහැර දක්වන්න.

2. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව කාන්තාවට අහිමි වූ වරප්‍රසාද පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.
(ii) ආධ්‍යාත්මික සංවර්ධනයෙහිලා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සනාථ කරන්න.
(iii) බුද්ධකාලීන කෝසල රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(iv) පවුල් සංස්ථාවේ ප්‍රභවය බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.
(v) 'දස රාජධර්ම' නිවැරදිව නම් කරන්න.

3. (i) සතර අගතිය කෙටියෙන් හඳුන්වන්න.
(ii) සිගාලෝවාද සූත්‍රයට අනුව ස්වාමි භාර්යා යුතුකම් හා වගකීම් ලියා දක්වන්න.
(iii) හිරි ඔතප් නොසලකන සමාජයක දැකිය හැකි පරිහානීය ලක්ෂණ **පහක්** ගෙනහැර දක්වන්න.
(iv) 'වසලකරණ ධර්ම' **අටක්** නම් කරන්න.
(v) 'කල්‍යාණ මිත්තතාව' මූලාශ්‍රය ඇසුරෙන් පහදන්න.

II කොටස

4. (i) සාවකසංඝ සමාජයේ ව්‍යුහය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.
(ii) ආර්ය මාර්ගය වැඩීමට ආකාරවතී ශ්‍රද්ධාව උපයෝගි වන ආකාරය පරීක්ෂා කරන්න.
(iii) පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම පෙන්වා දෙන්න.
(iv) බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්යය අත්විඳි ආකාරය පැහැදිලි කරන්න.

5. (i) 'පුරිසදම්ම සාරථී' බුදුගුණය උදාහරණ සහිතව විවරණය කරන්න.
(ii) ආදර්ශවත් නායකත්වයක් තුළ **කිබිය** යුතු මූලික ගුණාංග බුද්ධචරිතය ඇසුරින් ප්‍රකට කරන්න.
(iii) බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනය සඳහා යොදා ගත් විවිධ ක්‍රමෝපායයන් ගෙනහැර දක්වන්න.
(iv) යථාර්ථාවබෝධය සඳහා විදර්ශනා භාවනාවෙහි උපයෝගිතාව පෙන්වා දෙන්න.

[දෙවැනි පිටුව බලන්න.

Alevel Apis උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

6. (i) නිදහස් චින්තනයට බුදුදහමෙන් ලැබෙන පිටිවහල ප්‍රකට කරන්න.

(ii) බෞද්ධ පබ්බජ්ජාවේ ආරම්භය හා විකාශය කෙටියෙන් දක්වන්න.

(iii) වස් විසීම හා ඊට අදාළ ආගමික චාරිත්‍ර විධි පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

(iv) භාරතයේ ප්‍රකට ව පැවති පැරණි බෞද්ධ විශ්වවිද්‍යාල නම් කොට 'වලභි' විශ්වවිද්‍යාලය පිළිබඳ ඇගයීමක් කරන්න.

7. (i) සම්බුද්ධ පරිනිර්වාණය වන විට ධර්ම සංගායනාවක අවශ්‍යතාව පැනනැඟී තිබූ බවට සාක්ෂි ගෙනහැර දක්වන්න.

(ii) "ධර්ම සංගායනාවක අරමුණ වන්නේ ශාසන චිරස්ථිතියයි." දෙවන ධර්ම සංගායනාව ඇසුරින් සාකච්ඡා කරන්න.

(iii) 'වැවයි-දාගැබයි, ගමයි-පන්සලයි' යන සංකල්පයෙන් ඉපැරණි ශ්‍රී ලාංකේය සමාජයේ ලෞකික හා ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රකට වූ අයුරු පෙන්වා දෙන්න.

(iv) 'සෙන්' බුදු දහමෙන් ජපන් සංස්කෘතියට ලැබුණු ආලෝකය ප්‍රමාණ කරන්න.

8. (i) ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස බුදුසමයෙන් හැඩගැසුණු ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳව පවත්නා මතවාද කෙටියෙන් දක්වා, ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමාවල සම විෂමතා පෙන්වා දෙන්න.

(iii) "පටිමාඝරය පැරණි ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පයෙහි විශිෂ්ටත්වය ප්‍රකට කරන්නකි." තහවුරු කරන්න.

(iv) ශ්‍රී ලාංකේය වංශකථා සාහිත්‍ය බිහිවීමෙහිලා බෞද්ධ පූජනීය වස්තු විෂය වූ ආකාරය උදාහරණ මඟින් ප්‍රකට කරන්න.

***

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.